**<u>තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - 13 ශ්‍රේණිය - 1 වන සතිය - මැයි 4,5 හා 6</u>**

නිපුණතාවය 10 - බහු මාධ්‍ය තාක්ෂණය යොදා ගනිමින් වෙබ් අඩවි සංවර්ධනය කරයි.

HTML යනු කුමක්ද?

HTML යන්නෙහි අක්නම වන්නේ “HyperText Markup Language “ යන්නය.එය අපි අධි පාඨ සංලක්ෂණ භාෂාව ලෙස හඳුන්වමු. HTML යනු ක්‍රමලේඛ භාෂාවක් නොව සංලක්ෂණ භාෂාවකි.( Markup Language).මෙය,වෙබ් පිටුව විදැහු (render)කල යුතු ආකාරය අතරික්සුවට විධාන කිරීම සඳහා භාවිතා කරනු ලැබේ.සාමාන්‍යයෙන් පාඨ සංස්කාරකයක් (text editor)මගින් නිර්මාණය කර ලියනු ලබන කේත (codes),”html” දිගුව සහිත ගොනුවක් ලෙස සුරැකීමෙන් පසු එම ගොනුව වෙබ් අතරික්සුවක්(web browser) තුළින් හැඩසවි ගැන්වූ පාඨ සහ බහු මාධ්‍යය එකතුවක් ලෙස පරිවර්තනය කර ප්‍රදර්ශනය කළ හැකිය.

වෙබ් අතරික්සුව (සාමාන්‍යයෙන් අතරික්සුව ලෙස හැඳින්වේ) යනු ලෝක විසිරි වියමනෙහි ඇති වෙබ් පිටු විදැහු කර ගැනීම සඳහා භාවිතා වන මෘදුකාංග යෙදුමක් වේ. අතරික්සුවක් මගින් වෙබ් පිටුවක අන්තර්ගත රූප සහ වීඩියෝ වෙන වෙනම ඒකාකාර සම්පත් නිශ්චායකය(URL) මගින් හඳුනාගෙන,පරිශීලකයාගේ සංදර්ශක උපක්‍රම (display divices) මත විදැහු (render)කිරීමට හැකියාව ලබා දේ.

1.වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ අරමුණු මොනවාද?